සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

11 ශ්‍රේණිය	දෙවන වාර පරීක්ෂණය - 2024	14 S I,II

නම: ..... **කතෝලික ධර්මය** **කාලය පැය තුනයි**

01. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ 'විලාප ගී' ඇතුළත් පොත් කාණ්ඩය වන්නේ,
1. පංච පුස්තකය යි. 2. ඉතිහාස ග්‍රන්ථය යි. 3. ප්‍රඥා සාහිත්‍යය. 4. දිවැසි ග්‍රන්ථය ය.

02. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතට අනුව සුබ අස්න දේශනා කිරීම ආරම්භ වන්නේ,
1. ජෙරුසලමෙනි. 2. සමාරියාවෙනි. 3. ගලීලයෙනි. 4. රෝමයෙනි.

03. දරුණු පීඩන සමයක සැදැහැවතුන්ගේ විශ්වාසයේ ස්ථිරත්වය අරමුණු කර ගත් නව ගිවිසුම් ග්‍රන්ථය වනුයේ,
1. දානියෙල් ග්‍රන්ථය යි. 2. එළිදරව්ව ග්‍රන්ථය යි. 3. මාක් සුබාරංචිය යි. 4. ජොහාන් සුබාරංචිය යි.

04. එදිනෙදා ජීවිත අවස්ථාවන්ට ප්‍රඥාවන්තව මුහුණ දීම සඳහා සුදුසු උපදෙස් බහුලව දක්නට ඇත්තේ,
1. ගීතාවලියේ ය. 2. හිතෝපදේශයේ ය. 3. ජෝබ් කතාවේ ය. 4. සිරාක් ග්‍රන්ථයේ ය.

05. ජේසුස් වහන්සේට එරෙහිව පිලාත් ඉදිරියේ කළ චෝදනාවක් වන්නේ,
1. තමන් ක්‍රිස්තුස් නම් රජෙක් ලෙස පෙනී සිටින බවයි.
2. දේව මාළිගාව කඩා දමා අනෙකක් ගොඩ නඟන බවයි.
3. තමන් දේව පුත්‍රයා ලෙස හඳුන්වා දෙන බවයි.
4. අධිරාජයාට විරුද්ධව කටයුතු කරන බවයි.

06. මුල් කිතුණු සභාව තුළ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වූයේ පහත සඳහන් කවර කරුණක් සම්බන්ධයෙන් ද?
1. ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම්. 2. පූප කැඩීම. 3. සහනාධාර බෙදීම. 4. යාච්ඤාව.

07. තමන් ලද සිර දඬුවම මඟින් පවා දේව වචනය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් උදා කර ගත් ධර්මදූතයා වන්නේ,
1. ශු.පේදුරු තුමාය. 2. ශු. ස්තේපන් තුමාය. 3. ශු.ජුවාම් තුමාය. 4. ශු.පාවුළු තුමාය.

08. ජේසුස් වහන්සේ පේදුරු තුමා වෙත තුන් ප්‍රකාර කාර්ය භාරයන් පැවරීමට පෙර ඔහුගෙන් ඇසූ පැනය වන්නේ,
1. ඔබ මා කවරෙකු කියා කියන්නේ ද? 2. ඔබ මාගේ බැටළුවන්ගේ එඬේරා වන්නෙහිද?
3. ඔබ මා ප්‍රේම කරන්නෙහි ද? 4. ඔබ මා අනුව පැමිණෙන්නෙහි ද?

09. පෘතුගිසි සමයේ මෙරටට පැමිණි ධර්මදූත වරුන් නියැලුන විවිධ සේවා අතර විශේෂ ස්ථානයක් හිමි වූයේ,
1. අධ්‍යාපන සේවයට යි. 2. රෝහල් සේවයට යි. 3. සමාජ සේවයට යි. 4. දේවස්ථාන ඉදිකිරීමට යි.

10. ජීවනදායක භෝජනය පිළිබඳ ක්‍රිස්තු ඉගැන්වීම ඇතුළත් සුබාරංචි ග්‍රන්ථය වන්නේ,
1. මතෙව්. 2. මාක්. 3. ලූක්. 4. ජොහාන්.

11. දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතට සහභාගී වීම තුළින් අප ජීවිත වල ඔප් නංවා ගත යුතු ගුණාංගය වන්නේ,
1. භක්තිය යි. 2. ප්‍රේමය යි. 3. සාමය යි. 4. විශ්වාසය යි.

12. ''දයාවේ දූතිකාවෝ'' පැවිදි නිකාය ආරම්භ වූයේ,
1. ධ්‍යානශීලී ජීවිතයක් ගත කිරීමය. 2. ඒඩ්ස් රෝගීන්ට සරණ වීමටය.
3. අසරණයින් ට සරණ වීමටය. 4. ලෝක සාමය වෙනුවෙන් ක්‍රියා කිරීමට ය.

13. ''ඔබ අතර යමෙක් ප්‍රධානියා වන්න කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේය.'' යන ඉගැන්වීම සෘජුවම එල්ල වන්නේ,
1. පාලකයන් වෙතය. 2. පුරවැසියන් වෙතය. 3. දෙමාපියන් වෙතය. 4. දරුවන් වෙතය.

14. ''පරිසරයට හා මිනිසාට අහිතකර ව්‍යාපාර වල යෙදෙන්නා..... කඩ කරයි. මෙහි හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
1. 5 වැනි පණත. 2. 6 වැනි පණත. 3. 7වැනි පණත. 4. 8 වැනි පණත.

Past Papers Wiki

15. ''මාගේ ඇටකටු සෑදෙන විට, මව්කුසෙහි මා වැඩෙන විට රහසිගතව මා තැනෙන විට මා එහි වූ බව දැන සිටි සේක.'' යන ශුද්ධ වූ ලියැවිලි පාඨය දැක්නේනේ,
1. හිතෝපදේශයේ ය. 2. ජෙරමියා ග්‍රන්ථයේ ය.
3. කතෝලික සභා ධර්මෝපදේශයේ ය. 4. ගීතාවලියේ ය.

16. හය සහ නවය පණත් වලට සමගාමී වන 'භාග්‍යය' වන්නේ,
1. බැගෑ සිතින් දෙව් සරණ පැතීම ය. 2. සාමය ඇති කිරීමට කටයුතු කිරීම.
3. නිර්මල සිතක් ඇති කර ගැනීම ය. 4. යුක්තිය උදෙසා ක්‍රියා කිරීම ය.

17. ජනවන්දනා වර්ෂය තුළ, සාමන්‍ය සමයේ පවත්වන මංගල්‍යයන් පහත වරණය අතරින් තෝරන්න.
A - දිව්‍ය හෘදයේ මංගල්‍යය.
B - ශුද්ධ වූ පවුලේ මංගල්‍යය.
C - සියළු සාන්තුවරුන්ගේ මංගල්‍යය.
D - ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්‍යය.
E - ක්‍රිස්තු රජානන්ගේ මංගල්‍යය.
1. A B හා C 2. B E හා D 3. A D හා E 4. A C හා E

18. ඇතුළුවීමේ ගීතිකාව ගායනය කිරීමෙන් ජනතාවගේ ..... ප්‍රකාශ වෙයි. මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර වන්නේ,
1. විශ්වාසය. 2. එකමුතුකම. 3. භක්තිය. 4. ශ්‍රද්ධාව.

19. උත්තම පූජක යාච්ඤාව තුළ කැටි කර ඇත්තේ,
1. ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය යි. 2. ක්‍රිස්තු වහන්සේගේ දූත මෙහෙවරයි.
3. ක්‍රිස්තු ශ්‍රාවකයින්ගේ කාර්ය භාරය යි. 4. අනාගත සභාව වෙනුවෙන් කරන ආයාචනයයි.

20. ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤා කරන අවස්ථාවේදී ආසන්නයේ රැඳී සිටි ශ්‍රාවකයින් දෙදෙනෙකි.
1. පේදුරු හා මතෙව්. 2. ජාකොබ් හා ජොහාන්. 3. ජාකොබ් හා පිලිප්. 4. පේදුරු හා පිලිප්.

21. පංච පුස්තකය හඳුන්වන හෙබ්‍රෙව් වචනය වන්නේ,
1. ආබාද්. 2. ටෝරා. 3. අගපේ. 4. රාදා.

22. එළොහිම් සම්ප්‍රදායට අනුව, ජාකොබ්තුමා දෙවියන් වහන්සේව දර්ශනය කරන ලද්දේ,
1. කානාන්හිදී ය. 2. හෙබ්‍රෙන්හිදී ය. 3. ජෙරුසලම්හිදී ය. 4. බෙතෙල්හිදී ය.

23. පුරාණ ගිවිසුමේ අන්තර්ගත පොත් සංඛ්‍යාව 39 ක් ලෙස දැක්වෙන්නේ,
1. ග්‍රීක පිටපතේ ය. 2. ලතින් පිටපතේ ය.
3. මැසරොටික් පිටපතේ ය. 4. සෙප්ටුවාජින්තය පිටපතේ ය.

24. දෙවියන් වහන්සේ සැබැවින්ම අප දේවස්ථාන තුළ වැඩ වාසය කරන බව දර්ශනයකින් දුටු දිවැසිවරයා වන්නේ,
1. යෙසායා 2. ජෙරමියා. 3. එසනියෙල් 4. නොසියා

25. මතෙව්තුමා විශේෂයෙන් සිය සුභාරංචි පණිවිඩය ගෙන හැර පෑවේ,
1. රෝමය තුළ පීඩා විඳින ජනතාවට ය. 2. ජේසුස් වහන්සේගේ අනුගාමිකයින් ය.
3. යූදා ජනතාවට ය. 4. මුළු මහත් ලෝක වාසීන්ට ය.

26. ජොහාන්තුමා සිය සුභාරංචි ග්‍රන්ථය තුළින් අවධාරණය කරන්නේ,
1. කුරුසියේ මාර්ගය තුළින් පමණක් උත්ථානයට පංගුකාර විය හැකි බවයි.
2. දේව පුත්‍රයා අදහා ගැනීම තුළ සදාතන ජීවනය අත්කර ගැනීමට හැකි බවයි.
3. ජේසුස් වහන්සේ එකම ඇදුරාණන් සහ නීතිදායකයන් බවයි.
4. ජේසුස්තුමා සමාජයේ අසරණ වූවන් සඳහා කටයුතු කළ බවයි.

27. මිනිසාගේ උතුම්කම විද්‍යාමාන වන්නේ,
1. බුද්ධිය හා හෘද සාක්ෂියෙනි. 2. බුද්ධිය හා නිදහස් කැමැත්තෙනි.
3. හෘද සාක්ෂිය හා නිදහස් කැමැත්තෙනි. 4. ප්‍රඥාව හා හෘද සාක්ෂියෙනි.

28. අප ජීවිත පිළිබඳව දේව අභිමානයට අවනත විය යුත්තේ,
1. දේව නීතිය ඉටු කළ යුතු නිසාවෙ නි. 2. පූර්ණ නිදහස් කැමැත්තෙනි.
3. දේව දඬුවම් විඳීමට සිදුවේ යැයි බියෙනි. 4. දෙවිදුන් අප ස්වාමියාණන් බැවැනි.

29. කාන්තාර ගමනේ දී බීමට ජලය ලැබුණු ස්ථාන වන්නේ,
1. මස්සා , රෙපිඩීම්. 2. මස්සා, මාරා. 3. මෙරීබා, රෙපිඩීම් 4. මාරා, රෙපිඩීම්.

30. අහිමි කරගත් දේව සබඳතාව යළි ස්ථාපිත කිරීම සඳහා දෙවියන් වහන්සේ පොරොන්දු වූයේ,
1. ආදිමව්පියණ්ට ය. 2. ආබ්‍රහම්ට ය. 3. නෝවාම ය. 4. මොසෙස්ට ය.

31. අතීතයේ අයකැමියන් වෙත කළ අවවාද තුළින් වර්තාමනයේ අනාවරණය කරන්නේ,
1. එකිනෙකාගේ පොදු අවශ්‍යතාවය ඉටු කිරීමට දායකවන ලෙස යි.
2. අඩු වැටුපට සරිලන සේවයක් ලබා දීමට වගබලා ගත යුතුයි.
3. යූක්ති ගරුකව, සාධරණව රැකියා කටයුතු සිදු කිරීමටය.
4. ලැබෙන වැටුපෙන් සෑහි සිටීමට ය.

32. දූත කාර්ය්‍ය ආරම්භයේ දී ලෝකයේ රට රාජ්‍යය අත්කර ගැනමේ පරීක්ෂාව ජේසුස් වහන්සේ ජය ගනිමින් අපට ලබා දුන් පණිවිඩය වන්නේ,
1. තම බලය සමාජ යහපත සඳහා යෙදවිය යුතුය යන්නයි.
2. ශාරීරික ජීවිතයට වඩා අධ්‍යාත්මික ජීවිතය අගනා බවයි.
3. කිර්තිය පතා දේව සේවයේ නොයෙදිය යුතු බවයි.
4. තම ජීවිතය තුළ දෙවිදුන්ට හිමි තැන අන් කිසිවකට ලබා නොදිය යුතු බවයි.

33. දේව රාජ්‍යය සිය ජීවිතය තුළින්ම අත්දැකිමට කළයුතු වන්නේ,
1. පූණ්‍ය ක්‍රියාවන්හි යෙදීමය. 2. නිතිපතා දිව්‍ය පූජාවට සහභාගිවීම ය.
3. යාච්ඤාව මගින් වරප්‍රසාද අයැද සිටීම යි. 4. ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිත වෙනසක් අත් කර ගැනීමය.

34. අභිවෘධි ආලේපනයෙන් ලැබෙන වරප්‍රසාද පමණක් දැක්වෙන පිළිතුරු පහත වර්ණන අතරින් තෝරන්න.
A - අති ඉන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ අවයවයන් වීම.
B - ජීවිත අභියෝගවලට මුහුණු දීමේ ශක්තිය ලැබීම.
C - සත්‍යය සාධාරණත්වය ගැන එඩිතරව කතාකිරීමට ධෛර්ය්‍ය ලැබීම.
D - සැබෑ අධ්‍යාත්මික පුනර්ජීවනයක් ලැබීම.
E - ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දරන්නට නැති වීම.
1. A හා B 2. B හා C 3. C හා D 4. D හා E

35. ''සිත ඉරාගෙන දෙවිදුන් වෙත හැරී ඒම'' යන්නෙන් අදහස් වන්නේ,
1. තමන් කළ වැරදිවලට මනස්තාපනය වීමය. 2. නැවත පව් නොකිරීමට ඉටා ගැනීමය.
3. කළ වැරදි නිවැරදි කර ගැනීමටය. 4. කළ වැරදි පිළිකුල් කර හෙලා දැකීමය.

36.මූල් කිතුනු සභාව තුළ රෝගීන් ආලේප කිරීම සිදුකර ඇති බව සඳහන් හසුන් පත වන්නේ,
1. ජාකොබ් ය. 2. ජූද් ය. 3. හෙබ්‍රෙව් ය. 4. 1 කොරෙන්ති ය.

37. පැවිදි ජීවිතයට විනය මාලාවක් සකස් කිරීම සඳහා පූරෝගාමී වූයේ,
1. ශුද්ධ වූ අන්තෝනිතුමා ය. 2. ශුද්ධ වූ බෙනෙඩික්තුමා ය.
3. ශුද්ධ වූ ජෙරොම්තුමා ය. 4. ශුද්ධ වූ අම්බ්‍රෝසිතුමා ය.

38. පැවිදි ජීවිතයේ ලක්ෂණ නිවැරදිව සඳහන් වන්නේ,
1. සංසීක දිවිය හා එඬේරික දිවිය යි. 2. යාච්ඤාවේ දිවිය හා සංසික දිවිය යි.
3. සේවයේ දිවිය හා යාච්ඤාවේ දිවිය යි. 4. දිළිඳු දිවිය හා සංසික දිවිය යි.

39. ක්‍රිස්තුස් වහන්සේ විසින් පවරන ලද මිහිපිට දේවරාජ්‍ය පතළ කිරීම වගකීම සෘජුවම ඉටු කරන දූත සේවාවකි.
1. මරිය හමුදාව. 2. ජේසුස්තුමන්ගේ දිව්‍ය හෘදය සමිතිය.
3. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය යි. 4. කතෝලික දහම් පාසලය.

40. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ආසියාතික මූලස්ථානය පිහිටියේ,
1. පිලිප්ලීපනයේ ය. 2. ඉන්දියාවේ ය. 3. ශ්‍රී ලංකාවයේ ය. 4. ජෝර්දානය යි.

Past Papers Wiki

ii කොටස

01. 1. නව ගිවිසුමේ හසුන් පත් බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.
2. ශුද්ධ වූ සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.
3. මහා බ්‍රහස්පතින්දා දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කළ බව සඳහන් සුබාරංචි දෙකක් නම් කරන්න.
4. පළමු පණතට පදනම් වන ගුණාංග දෙකක් ලියන්න.
5. ජනවන්දනා වර්ෂයේ කාල වකවානු දෙකක් ලියන්න.
6. දේශක දිවැසිවරු දෙදෙනෙකු නම් කරන්න.
7. ඊශ්‍රායෙල් ගෝත්‍ර දෙකක් නම් කරන්න.
8. ස්නාවක ජොහාන් තුමා අවවාද කළ කණ්ඩායම් දෙකක් නම් කරන්න.
9. මනස්තාපයේ දෙ ආකාරය නම් කරන්න.
10. ගිහි ධර්මදූත සේවා දෙකක් නම් කරන්න.

02. 1. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් ලියන්න.
2. දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් තුනක් ලියන්න.
3. දිව්‍ය පූජාවට අර්ථවත්ව සහභාගී වී අධ්‍යාත්මික ව පෝෂණය වූ ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.

03. 1. පිළිගත් කිතුනු සභා ප්‍රධාන කොටස් දෙකක් නම් කරන්න.
2. උත්තම පූජක යැදුමේ ප්‍රධාන කොටස් තුන නම් කරන්න.
3. මල් උයනේ යාච්ඤාව තුළ ක්‍රිස්තුස් වහන්සේ දේව කැමැත්තට අවනතව ක්‍රියා කළා සේ ඔබේ දිවිය තුළ දේව කැමැත්ත ඉටු කරන ආකාරය ගැන කරුණු පහක් දක්වන්න.

04.1. 'දිවැසිවරයා' යන්නට යෙදෙන හෙබ්‍රෙව් හා ග්‍රීක නාම ලියන්න.
2. දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ තුනක් ලියන්න.
3. ප්‍රසාද ස්තාපනය තුළින් ලබන දිවැසි කැඳවීම අනුව පාසල් සමාජය තුළ ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු පහකින් දක්වන්න.

05.1. දෙවියන් වහන්සේ විසින් මිනිසා සමඟ කරන ලද ගිවිසුම් දෙකක් ලියන්න.
2. දසපණත තුළ ඇති දෙවියන් වහන්සේ වෙත මිනිස් අපගේ යුතුකම් දැක්වෙන පණත් තුනක් ලියන්න.
3. දස පණත අනුසාර කරමින් අසල්වැසියා වෙත ප්‍රේමය ප්‍රකාශ කිරීමට ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු පහකින් විස්තර කරන්න.

06.1. කිතුණු විවාහයේ ලක්ෂණ දෙකක් ලියන්න.
2. විවාහ පොරොන්දුවේ අඩංගු කරුණු තුනක් ලියන්න.
3. සාර්ථක කතෝලික විවාහ දිවියක් ගත කිරීම සඳහා ඔබ කරන යෝජනා පහක්.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.
1. පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය.
2. සත්‍යගරුකව ජීවත් වෙමු.
3. සිත් හැරීමේ ප්‍රසාද නිධානයේ අවශ්‍යතාව.
4. සුභාරංචිය මඟින් පෙන්වා දෙන කිතුනු සාරධර්ම.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිළිතුර පත්‍රය - i කොටස

01) 4	02) 1	03) 2	04) 2	05) 1	06) 3	07) 4
08) 1	09) 1	10) 4	11) 2	12) 3	13) 1	14) 1
15) 4	16) 3	17) 4	18) 3	19) 2	20) 3	21) 1
22) 2	23) 3	24) 1	25) 3	26) 2	27) 2	28) 1
29) 3	30) 1	31) 3	32) 4	33) 4	34) 2	35) 1
36) 1	37) 2	38) 3	39) 4	40) 1		

ii කොටස

01.1. ශු.පාවුලුතුමාගේ ලිපි /වෙනත් ලිපි. (පි.04, 10 ශ්‍රේණිය)
2. ඒකත්වය/ ශුද්ධත්වය/ කතෝලිකත්වය/ අපෝස්තලිකත්වය. (පි.34, 10 ශ්‍රේණිය)
3. ශු.මතෙව් සුබාරංචිය, ශු.මාක් සුබාරංචිය, ශු.ලූක් සුබාරංචිය. (පි.04, 10 ශ්‍රේණිය)
4. විශ්වාසය/ බලාපොරොත්තු/ ප්‍රේමය. (පි.64, 10 ශ්‍රේණිය)
5. ආගමන සමය/ නත්තල් සමය/ සාමාන්‍ය සමය i අදියර/ සාමන්‍ය සමය ii අදියර/ චතාරික සමය/ පාස්කු සමය. (පි.106, 10 ශ්‍රේණිය)
6. නාතාන්, හුල්දා/ එලියා, අහියා/ එලිෂා, මිකායා. (පි.09, 11 ශ්‍රේණිය)
7. රූබන්/ සිමියොන්/ ලෙවි/ ජෝසෙප්/ ජුදූ/ ඉස්සාකර්/ සාබ්‍රලොන් බෙන්ජමින්/ දාන්/ නප්තලි/ ගාද්/ අෂේර්. (පි.27, 11 ශ්‍රේණිය)
8. ජනතාවට/ අයකැමියන්ට/ සෙබඵන්ට. (පි.41, 11 ශ්‍රේණිය)
9. දයාධික මනස්ථාපනය/ භයාධික මනස්ථාපනය. (පි.66, 11 ශ්‍රේණිය)
10. කතෝලික තරුණ සංගමය/කිතුදාන පුබුදුව/දේව මාතා දරු සමාගම/කතෝලික දහම් පාසල/ධර්මදූත ළමා සමාජය.(පි.86, 11 ශ්‍රේණිය)

02. 1. දේව ප්‍රසාද නිධානයක්/ භෝජනයක්/ යාගයක්/ ගිවිසුමක්/ ස්තුති කිරීමකි. (පි.44,45, 10 ශ්‍රේණිය)
2. ප්‍රප කැඩීම/ ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය/ නව පාස්කු මංගල්‍යය/ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගියකට. (පි.46, 10 ශ්‍රේණිය)
3. පියතුමාගේ දේශනය තුළින් ලබා ගත් දැනුම ජීවිතය අර්ථවත් කර ගැනීමට යොදා ගැනීම./ දිව්‍ය සත්ප්‍රසාද වනන්තේ ලබා ගැනීම නිසා ලද ශක්තිය අන් අයට සේවය කරණට යොදා ගැනීම/ අන් අය වෙනුවෙන් කැඩෙන්නට බිඳෙන්නට හැකියාව සහ අවශ්‍යතාව ඇති කර ගැනීම/ පව් කමාව තුළ නව ජීවනයක ප්‍රබෝධය අත්වීම.

03.1. පිළිගත් කිතුනු සභා/ මුලධර්මවාදී සභා. (පි.123, 10 ශ්‍රේණිය)
2. ජේසුතුමා තමන් වෙනුවෙන් යාච්ඤා කිරීම/ ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම/ අනාගත සභාවේ එකමුතු ව වෙනුවෙන් යාච්ඤා කිරීම. (පි.122, 10 ශ්‍රේණිය)
3. • තමන්ට පැන නගින ප්‍රශ්න හමුවේ ගොබියව මුහුණ දීම. • යාච්ඤාව තුළ දේව කැමැත්ත වටහා ගෙන ක්‍රියා කිරීම.
• පරාර්ථකාමීව අනුන් වෙනුවෙන් කැප වීම. • අන්‍යයන්ගේ සුබසිද්ධිය සැළසීම සඳහා වැය වීම.

04. 1. හෙබ්‍රෙව් - නබී/ ග්‍රීක - ප්‍රොෆේටේඩ්. (පි.09, 11 ශ්‍රේණිය)
2. ධ්‍යානයට සමවැදීම/ කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම/ තම දුක මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම්. (පි.09, 11 ශ්‍රේණිය)
3. • තමන් සතු දැනුම නිර්ලෝභීව අන් අය සමග බෙදා ගැනීම. • සත්‍යය සාධාරණත්වය වෙනුවෙන් නොබිය ව පෙනී සිටීම.
• අනෙකාගේ අවශ්‍යතා සඳහා වැය වීම.

05.1. ආදිමව්පියන් සමඟ/ නෝවාසමඟ/ ආබ්‍රහම්තුමා සමඟ/ සිනයි ගිවිසුම.(පි.33,34,35, 11 ශ්‍රේණිය)
2. • මා හැර අන් කිසිම දෙව් කෙනෙකු නුඹට නොයිටිය යුතුය. • නුඹ දෙව් සම්දාණන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත නොකරව. • සබත් දින ශුද්ධ ලෙස ගත කිරීමට සිතට ගන්න. (පි.36, 10 ශ්‍රේණිය)
3. 1. දෙමාපිය වැඩිහිටියන් ගෞරවයෙන් සැලකීම. 2. අන් අයගේ දියුණුව සඳහා ගැනනීමට උපකාර කිරීම.
3. තමන් සතු දේ අන් අයගේ යහපත සඳහාද යෙදවීම. 4. අවශ්‍යතාවෙන් පෙළෙන්නන්ට උපකාර කිරීම.

06. 1. එකත්වය/ අඛණ්ඩත්වය. (පි.77, 11 ශ්‍රේණිය)
2. මුළු ජීවිත කාලය තුළදී මම ඔබට ප්‍රේම කිරීමට./වාසනාවන් කල්හි අවාසනාවන් කල්හිද ලෙඩ දුකේදී හා සුව සැපේදී ද විශ්වාසිව සිටීමට./ ගෞරව කිරීමට. (පි.79, 11 ශ්‍රේණිය)
3. යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම/ අන්‍යෝන්‍ය ප්‍රේමය හා විශ්වාසය තුළ ජීවත් වීම/ පිරිසිදු චරිතය/ පරිත්‍යාගී ජීවිතය/ පවුලේ සාමූහිකත්වය වෙනුවෙන් කටයුතු කිරීම/ විවාහ ජීවිතයේ වගකීම් වෙත අධ්‍යාත්මික ප්‍රවේශය යනාදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

07.1. පිටු අංක 23,24 (10 ශ්‍රේණිය)
2. පිටු අංක 100,103 (10 ශ්‍රේණිය)
3. පිටු අංක 65,67 (11 ශ්‍රේණිය)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank